සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 | S | I

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

# ක්‍රිස්තු ධර්මය I

කාලය පැය දෙකයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.

01. බයිබලය සඳහා යෙදෙන ලතින් වචනය වන්නේ ,
1. බිබ්ලෝස් 2. ටා බිබ්ලියා 3. බිබ්ලියොන් 4. වල්ගේට් 5. බිබ්ලියා

02. ද්විතීය සම්මත ග්‍රන්ථ යන්නෙහි අර්ථය වන්නේ,
1. ද්විත්ව අර්ථයන් සහිත ග්‍රන්ථ 2. දේවානුභාවයෙන් රචිත ග්‍රන්ථ 3.දේව නීතිය සහිත ග්‍රන්ථ
4. දෙවනුව සම්මත වූ ග්‍රන්ථ 5. ද්විත්වවාදය අන්තර් ගත ග්‍රන්ථ

03. ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කළේ,
1. ශුද්ධවූ අගුස්තීනු තුමා 2. ශුද්ධවූ ටර්ටූලියන් තුමා 3. ශුද්ධවූ සිරිල් තුමා
4. ශුද්ධවූ ඔරිගන් තුමා 5. ශුද්ධවූ ජෙරෝම් තුමා

04. ඉතා සාරවත් හා ජනාකීර්ණ ප්‍රදේශයකි,
1. පලස්තීනය 2. සෙසරය 3. අක්කෝ මිටියාවත 4. සමාරියාව 5. හේබ්‍රෝන්

05. දාවිත් රජ තුමා ජුදාහි රජතුමා ලෙස අභිෂේක කරන ලද ස්ථානය වන්නේ,
1. බෙයර්ෂෙබා 2. බෙතෙල් 3. දාන් 4. පලස්තීනය 5. හේබ්‍රෝන්

06. විප්‍රවාස සමයේදී ජුදෙව්වන් විප්‍රවාසය දෙස බැලුවේ,
1. දෙවියන් තමන්ගෙන් ඈත්ව ඇති ආකාරය 2. තමන්ට ලැබිය යුතු සුදුසු දඬුවමක් ලෙසය
3. දේව අපහාසයට ලක්ව ඇති බව 4. දෙවිඳුන්ගේ ප්‍රතික්ෂේප වීමේ ලකුණක් ලෙස
5. තමන්ට ලැබිය යුතු වරප්‍රසාද අහිමි වීමක් ලෙස

07. එස්රා පූජකයෙකි. ඔහුගේ කාර්යය සඳහන් නිවැරදි වරණය වන්නේ ,
A . විදේශීය භාර්යාවන්ට ඉඩ කඩ සැලසීම B - ගිවිසුම අලුත් කිරීම
C - ව්‍යවස්ථාවලිය කියවීම D - සබත් නිවාඩුව ක්‍රියාත්මක කිරීම
1. ABC 2. BCD 3. CBA 4. DBA 5. ACD

08. සාවුල්ව රජතුමා ලෙස ජනතාවට සාමුවෙල් විසින් හඳුන්වා දුන් ස්ථානය වන්නේ ,
1. මිස්පා හිදීය 2. ගිබියොන් හිදීය 3. ජොප්පාවේදීය
4. දෝතාන්හිදීය 5. ඒලෝන් ගස අසලදීය

09. ග්‍රීක සංස්කෘතිය හා ඇදහිලි ක්‍රම අන් ජාතීන් වෙත බලෙන් පැටවූ රජතුමා වන්නේ,
1. ඇලෙක්සැන්ඩර් රජ 2. සයිරස් රජ 3. IV ඇන්ටියෝකස් එපිපානෙස්
4. මහා හෙරෝද් රජ 5. ශෙදකියා රජ

10. නායක පූජක වරුන්ගේ පරම්පරාව පැවත එන්නේ කවර පූජක පරම්පරාවෙන්ද,
1. ලෙවී 2. ආරොන් 3. මෝසේස් 4.ශදොක් 5. මෙල්කිසදෙක්

11. ඇන්ටෝනියා මාලිගය තම නිවසක් ලෙස පිහිටුවා ගත්තේ ,
1. පොන්තියුස් පිලාත් 2. හෙරෝද් පිලිප් 3. මහා හෙරෝද්
4. හෙරෝද් ඇන්ටිපස් 5. අර්කෙලාවුස්

12. ජුදයාව සමාරිය හා ඉදුමිය පාලනය කළේ ,
1. ආණ්ඩුකාර හෙරෝද් ඇන්ටිපස් 2. ආණ්ඩුකාර දෙවන හෙරෝද් පිලිප් 3. ආණ්ඩුකාර අර්කෙලාවුස්
4. ආණ්ඩුකාර පොන්තියුස් පිලාත් 5. ආණ්ඩුකාර මහාහෙරෝද්

13. ගලීලය හා පෙරියාවෙහි යුව රජ වන්නේ ,
1. මහා හෙරෝද් 2. හෙරෝද් ඇන්ටිපස් 3. ජෙරබොවාම්
4. අන්තියොකුස් එපිපානස් 5. අර්කෙලාවුස්

14. ශුද්ධ බයිබලයේ පසුබිම ගැන ගැඹුරු විමර්ශනයක යෙදුනු ලුතරන් නිකායට අයත් පුද්ගලයන් සහිත වරණය වන්නේ,
A - එච්. ග්‍රාෆ් B - ජූලියස් වෙල්හවුසන් C - වෙට්ට
D - රේමන් බ්‍රවුන් E - එච්. ක්වේන්
1. ABCD 2. BCDE 3. ACDE 4. ABDE 5. ABCE

15. ඊශ්‍රායෙලයේ ඉපැරණි ආගමක හා නීතිමය සංකලනයකි,
1. J සම්පදාය 2. E සම්ප්‍රදාය 3, D සම්ප්‍රදාය 4. L සම්ප්‍රදාය 5. P සම්ප්‍රදාය

16. දෙවියන් වහන්සේ සඳහා ''එලෝහිම්'' යනුවෙන් ආමන්ත්‍රණය කරන ලබන සම්ප්‍රදායන් දෙකකි,
1. පූජක , යාවේ 2. එලෝහිම් පූජක 3. පූජක , කුවෙල් 4. ද්විතීය නීති, පූජක 5. යාවේ , කුවෙල්

17. මෝසෙස් තුමාට පමණක් කළ හැකි ප්‍රාතිහාර්යය වූයේ,
1. ජලය ලේ වීම 2. ගල් වර්ෂාව 3. කිනිතුලු උවදුර 4. පළගැටි උවදුර 5. මැසි උවදුර

18. දෙවියන් වහන්සේ මිනිසුන් අතර සුපිරි මිනිසකු ලෙස ඉදිරිපත් කරන සම්ප්‍රදාය වන්නේ,
1. J සම්පදාය 2. E සම්ප්‍රදාය 3, D සම්ප්‍රදාය 4. L සම්ප්‍රදාය 5. P සම්ප්‍රදාය

19. එලෝහිම් සම්ප්‍රදායට අනුව ඒක දේව වාදය ආරක්ෂා කිරීමේ නියමුවරු වූයේ,
1. ආදිපිතෘවරු 2. පූජකයන් 3 දිවැසිවරුන් 4. රජවරුන් 5. නායක පූජකයන්

20. උතුරු රාජ්‍යයේ තිබූ භයානකම අවදානම වූයේ,
1. බාල් වන්දනාව 2. රේ වන්දනාව 3. සූර්ය නමස්කාරය
4. අෂ්ඨාරොත් වන්දනාව 5. ඒක දේව වන්දනාව

21. පූජක සම්ප්‍රදායට අයත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

A - සබත දෙවිඳුන් සම්මුඛ වන දිනයකි.
B - දෙවිඳුන්ගේ වැඩ සිටීම දේව මාලිගයේය.
C - ජනවන්දනාවට පළමු තැන හිමිවේ
D - මිනිසාට දෙවිඳුන් වෙත ලගා විය හැකිය.
E - කූඩාරමත් ධර්මශාලාවත් දේව බලය ප්‍රකාශ වන ස්ථානය

1. ABC 2. BCD 3. BCE 4. ADE 5. ACE

22. මැවීම පිළිබඳ දෙවන කථාවට පසුබිමක් සපයන්නේ,

1. සුමේරියානු ජන කතා 2. බාබෙල් කොත 3. නික්මයාමේ සිද්ධිය
4. ගිල්ගමේෂ් වීර කාව්‍යය 5. බැබිලෝනියානු වීර කාව්‍යය

23. පුරාණ බටහිර ආසියාවේ මුල්ම කර්මාන්තය වන්නේ,

1. වානේ කර්මාන්තය 2. ගඩොල් කර්මාන්තය 3. මැටි හා කීල් කර්මාන්තය
4. කුඹල් කර්මාන්තය 5. කෘෂි කර්මාන්තය

24. දූහුවිල්ල සඳහා යෙදෙන හේබ්‍රෙව් වචනය වන්නේ,

1. ආදම් 2. ආපාර් 3. අදමාහ් 4. කොහේන් 5. ආමර්

25. හොඳ නරක දැන ගැනීමේ ගස යනුවෙන් අදහස් කරන්නේ,

1. අමරණියත්වය 2. ජීවිතයේ පැවැත්ම 3. දේව සමානාත්මතාව
4. සදාචාරයේ ආදිපත්‍යය 5. නිවහල් බවේ ආධිපත්‍යය

26. මිනිසා පාපයට වැටීමේ කථා පුවත රචනා කර ඇත්තේ,

1. එලෝහිම් සම්පදාය 2. තුඩෙල් සම්ප්‍රදාය 3, යාවේ සම්ප්‍රදාය
4. පූජක සම්ප්‍රදාය 5. ද්විතීය නීති සම්ප්‍රදාය

27. දෙවියන් වහන්සේ කායින් මත තැබූ ලකුණින් සංකේතවත් වන්නේ,

1. දේව ආදරයේ ලාංඡනයකි 2. දේව දයාවේ ලාංඡනයකි 3 දේව රැකවරණයේ ලාංඡනයකි
4. දේව මඟ පෙන්වීමේ ලාංඡනයකි 5. දේව මැදිහත් වීමේ ලාංඡනයකි

28. ඉශ්‍රායෙල් ඉතිහාසයේ ආරම්භය වන්නේ,

1. දිවැසිවරුන්ගෙන් ය. 2. ආදිපිතෘවරුන්ගෙන් ය. 3. වීරවරුන්ගෙන් ය.
4. රජවරුන්ගෙන් ය. 5. ජන නායක යුගයෙන් ය.

29. ප්‍රසාද ස්නාපනයේ පෙර නිමිත්තක් වන්නේ,

1. නික්මයාම 2. නුමුහුන් පූප 3. චර්මඡේදනය 4. මිදියුෂ පානය 5. පාද දෝවනය

30. උත්පත්ති 15 : 17 හි සඳහන් දිලිසෙන ගිනි හුලෙන් සංකේතවත් කරන්නේ,

1. රාජකීයත්වය 2. ගිවිසුමේ නව සම්බන්ධතාවය 3. පොරොන්දු ඉටු වීම
4. දේව ප්‍රේමය 5. දෙවියන් වහන්සේ

31. ජාකොබ් තුමා තම අනාගත දේව සැලැස්ම තේරුම් ගත් බෙතෙල් නම් ස්ථානයේ අර්ථය වන්නේ,

1. දෙවියන් වහන්සේගේ නවාතැන් පොළ 2. දෙවියන් වහන්සේගේ ගෘහය 3. දේව ජනතාව
4. දෙවිඳුන් මඟ පෙන්වන ස්ථානය 5. දේවාශිර්වාදය

32. මුල් යුගයේදී ශුද්ධ ලියවිල්ල ග්‍රන්ථාරූඪ කෙරුණේ,
1. පැපිරස් පදම්කර සාදන ලද හැකුලුම් පත්වල
2. පැපිරස් පදම්කර සෑදූ පිටු සහිත පොත් වල
3. පැපිරස් පදම්කර සෑදූ පිටු වලය
4. පැපිරස් පදම්කර සෑදූ පැඳුරු වල
5. පැපිරස් පදම්කර සෑදූ කුළුණු වල

33. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසුව ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට ඇතුළත් වූ පොත් ලියන ලද භාෂාව වූයේ,
1. හේබ්‍රෙව් භාෂාව 2. ඇරමයික් භාෂාව 3. ලතින් භාෂාව 4. ග්‍රීක භාෂාව 5. ඉංග්‍රීසි භාෂාව

34. ක්‍රි. පූ. 333 දි පලස්තීනය ආක්‍රමණය කළ ග්‍රීක අධිරාජයා වන්නේ, ,
1. නෙබුකද්නෙශර් 2. නීරෝ 3. ඩොමීෂියන් 4. මහා ඇලෙක්සැන්ඩර් 5. ට්‍රාජන්

35. පුරාණ ගිවිසුමේ සම්මත පොත් වශයෙන් පොත් 46 ක් පිළිබඳ ප්‍රකාශ කරන ලද මණ්ත්‍රණ සභා දෙකක් වන්නේ,
1. දෙවන ජගත් මන්ත්‍රණ සභාව හා ත්‍රිදෙන්තීනු ජගත් මන්ත්‍රණ සභාව
2. හිප්පෝ ජගත් මන්ත්‍රණ සභාව හා ජෙරුසලම් මන්ත්‍රණ සභාව
3. දෙවන වතිකාන ජගත් මන්ත්‍රණ සභාව හා ත්‍රිදෙන්තීනු ජගත් මන්ත්‍රණ සභාව
4. ත්‍රිදෙන්තීනු ජගත් මන්ත්‍රණ සභාව හා හිප්පෝ ජගත් මන්ත්‍රණ සභාව
5. හිප්පෝ ජගත් මන්ත්‍රණ සභාව හා දෙවන වතිකාන ජගත් මන්ත්‍රණ සභාව

36. මුළු ශුද්ධ ලියැවිල්ලම දේවානුභාවයෙන් යුත් බව සඳහන් වන නව ගිවිසුම් ග්‍රන්ථය වන්නේ,
1. 1 තිමොති 2. 2 තිමොති 3. 1 පේදුරු 4. රෝම 5. 1 කොරින්ති

37. ශුද්ධ බයිබලයේ කතෘවරයාණන් පිළිබඳ අදහස තහවුරු කරන ලද විශ්ව ලේඛනය නම්,
1. ලෝක සාමය
2. වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව
3. කතෝලික සහා ධර්මෝපදේශය
4. දිව්‍ය සංරක්ෂණය
5. ගැලවුම්කරුවාණන්ගේ දහම් දූත සේවය

38. ඉශ්‍රායෙලය උතුරු හා දකුණු ලෙස වෙන්වූ පසු එම රාජ්‍යය වල අගනුවරවල් පිළිවෙලින්,
1. ෂෙකෙම් හා ජෙරුසලම
2. ෂෙකෙම් හා බෙතෙල්
3. ජෙරුසලම හා ෂෙකෙම්
4. ජෙරුසලම හා බෙතෙල්
5. බෙතෙල් හා දෝතාන්

39. ක්‍රි. පූ. 722 දී පමණ ඉශ්‍රායෙලුන් වහලුන් ලෙස තම රටට රැගෙන ගිය අධිරාජ්‍යය නම්,
1. බැබිලෝනීය අධිරාජ්‍යය
2. ග්‍රීක අධිරාජ්‍යය
3. රෝම අධිරාජ්‍යය
4. අසිරියානු අධිරාජ්‍යය
5. පර්සියානු අධිරාජ්‍යය

40. ධර්මශාලා නොහොත් (සිනගෝග) ආරම්භ වන්නේ,
1. ජේසුස් වහන්සේගේ කාලයේ
2. අසිරියානු අධිරාජ්‍යය සමය
3. පර්සියානු අධිරාජ්‍ය සමය
4. දාවිත් රජ සමය
5. බැබිලෝනියානු විප්‍රවාස සමය

41. බැබිලෝනියේ ජීවත්වූ ජුදෙව්වන් අදියර තුනක් යටතේ තම මව්බිම කරා ගියහ. එහිදී පිළිවෙලින් කණ්ඩායම් නායකත්වය ගත්තේ,
1. නෙහෙමියා,එස්රා හා සෙරුබ්බාබෙල්
2. සෙරුබ්බාබෙල් , එස්රා හා නෙහෙමියා
3. එස්රා , සෙරුබ්බාබෙල් හා නෙහෙමියා
4. නෙහෙමියා, සෙරුබ්බාබෙල් හා එස්රා
5. එස්රා , නෙහෙමියා හා සෙරුබ්බාබෙල්

42. දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලය තුලින් හැඬගසන්නේ හා පුහුණු කරන්නේ කිතුණුවන් මිස ගණිතඥයන් නොවන බව ප්‍රකාශ කළේ,
1. ශු. අන්තෝනි තුමා 2. ශු. ජස්ටින් තුමා 3. ශු.අගුස්තීනු තුමා
4. ශු. තෙරේසා තුමිය 5. ශු.බෙනඩික් තුමා

43. ශු බයිබලයේ ප්‍රාග් ඉතිහාසය රචනා වීමට භාවිතා වූ සම්ප්‍රදායන් දෙකකි.
1. පූජක , යාවේ 2. යාවේ, එලෝහිම් 3. පූජක , ද්විතීය නීති
4. යාවේ හා ද්විතීය නීති 5. පූජක හා එලෝහිම්

44. ශුද්ධ බයිබලයේ පළමු මැවීමේ කථාව ඉදිරිපත් කිරීමේදී සෑම දවසකටම පොදු වූ කාරණයක් නොවන්නේ,
1. දේව ආඥාව 2. දේව ආඥාව ඉෂ්ඨ වීම 3. දේව මැවිල්ල අගය කිරිම
4. දඬුවම් ලැබීම 5. කාලය ගණන් කිරීම

45. දෙවියන් වහන්සේ මිනිසා ඒදන් උයනින් පිටත මවා ඒදන් උයනෙහි පිහිටු වීමෙන් අදහස් කරන්නේ ,
1. මිනිසාගේ නිදහස සීමා සහිත බවය
2. මිනිසා ලැබිය යුතු ප්‍රමාණයට වඩා ලබා ඇති බවය
3. මිනිසාට ලැබිය යුතු දේ නිවැරදිව පෙන්වා ඇති බවය.
4. අසීමිත ආශා මිනිසා පාලනය කරගත යුතු බවය
5. මිනිසා දුර්වල නිසා නිරතුරු දේව රැකවරණය අවැසි බවය

46. පාපය නිසා අනාරක්ෂිත වූ මිනිසාට දෙවියන් වහන්සේ රැකවරණය සලසා දුන් බව ප්‍රකාශ වන්නේ,
1. නෝවා තෝරා ගැනීමෙනි 2. ආදම් සහ ඒවාට හම් වස්ත්‍ර සාදා ඇන්දවීමෙනි.
3 ආදම් ඒවට දඬුවම් කිරීමෙනි 4. කායින්ව නෙරපා දැමීමෙනි
5. බාබෙල් කොතේ වියවුල නිම කිරීමෙනි

47. ආබ්‍රහම් තමා දෙවියන් වහන්සේ හා කළ ගිවිසුම ගිවිසුම් දෙකකින් දැක්වේ එම සම්ප්‍රදායන් දෙක නම්,
1. යාවේ, එලෝහිම් 2. පූජක හා එලෝහිම් 3. එලෝහිම් පූජක
4. යාවේ , පූජක 5. යාවේ හා ද්විතියික නීති

48. මෝසෙස් පාරාවෝ හා ගනුදෙනුවකින් තොරව ක්‍රියාත්මක කරන වසංගත තුනකි. ඉන් දෙකක් වන්නේ,
1. මැඩි හා මැසි 2. කිනිතුලු හා පළගැටි 3. ගනඳුරු හා පළගැටි
4. ගඩු හා ගනඳුරු 5. වතුර ලේ වීම හා කුළුඳුලන්ගේ මරණය

49. "ජොහානීය දේහය"යන ග්‍රන්ථ වලට ඇතුලත් නොවන ග්‍රන්ථය වන්නේ,
1. රෝම හසුන 2. 1 ජොහාන් හසුන 3. ශු,ජොහාන් සුභාරංචිය
4. එළිදරව්ව ග්‍රන්ථය 5. 2 ජොහාන් හසුන

50. මෝසෙස් තුමා අයත් ගෝත්‍රය වන්නේ,
1. ලෙවී 2. බෙන්ජමින් 3. ජුදා 4. සිමියොන් 5. අශේර්

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 | S | II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 12 - 2019

විභාග අංකය ............................ **ක්‍රිස්තු ධර්මය II** කාලය පැය තුනයි

- **I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

## I කොටස

01. I. "සරු අඩ සඳ " නම් ප්‍රදේශයට අයත් පුරාණ ප්‍රධාන ශිෂ්ඨාචාර දෙකක් නම් කරන්න.

II. ගලීල මුහුද ක්‍රිස්තුන් වහන්සේගේ දහම් සේවයේ කේන්ද්‍රස්ථානයකි. ගලීල මුහුද අවට පිහිටි නගර හතරක් නම් කරන්න.

III. සලමොන් රජුගේ කාලය වෙනස්කම් රැසක් සිදු වූ කාලයකි. එම වෙනස්කම් 6ක් ලියා දක්වන්න.

IV. ජන නායකයන් විවිධ අභියෝග බාධක හමුවේ නොසැලී ක්‍රියා කළාක් මෙන් ඔබත් පාසල් සිසුවෙකු ලෙස වර්තමාන සමාජයෙන් ඔබට එල්ල වන අභියෝග, බාධක 4ක් නම් කර ඒවා ජය ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

02. I. ශුද්ධ බයිබලයේ කතෘත්වය පිළිබඳ සභා පියවරුන්ගේ යුගයේ සිටම පිළිගැනීමට ලක්වූ කරුණු 2ක් සඳහන් කරන්න..

II. දේවානුභාවයෙන් ලේඛනගත කරන ලද ශුද්ධ ලියවිල්ලේ අරමුණු 3ක් ලියන්න.

III. දේවානුභාවයේ ප්‍රභේද 3 නම් කර, එක් නිදර්ශනය බැගින් ලියා දක්වන්න.

IV. වර්තමාන සමාජය තුළ ජීවත්වන කිතුණු දරුවකු වන ඔබට දෙවියන් වහන්සේ අනාවරණය වන මාර්ග 4ක් නිදර්ශන 4ක් සමඟින් ලියා දක්වන්න.

03. I. "ටෝරා" යන්නෙහි අර්ථයන් දෙකක් නම් කරන්න.

II. පංච පුස්තකය තුළ පුන පුනා කීම් හා පරස්පර විරෝධී ව්‍යවහාර දක්නට ලැබෙන බවට නිදර්ශන දෙකක් ලියන්න.

III. යාවේ සම්ප්‍රදාය තුළ මානව රූපාකාරය යොදා ඇති බවට නිදර්ශන 03ක් ලියා දක්වන්න.

IV. පූජක සම්ප්‍රදාය තුළ සබත් දින ශුද්ධ ලෙස ගත කිරීම පිළිබඳ අවධාරණය කරන අතර, සබත්දින ශුද්ධ ලෙස ගත කිරීමට ඔබ ගන්නා ක්‍රියා මාර්ග 4ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

## II කොටස

04. I. සර්පයා හෙවත් රුවියේ දෝංකාරයට සවන් දී රුවියට වහල් වීම නිසා සර්පයාට, ස්ත්‍රීයට හා පුරුෂයාට දඬුවම් ලැබෙන ආකාරය පැහැදිලි කර පව්කාර වූ මිනිසාට දිව්‍ය සංරක්ෂණය සලසා දෙන අයුරු නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

II. රුවියට වහල්ව දේව ප්‍රේමයට විරුද්ධව ක්‍රියා කරන ඔබේ මිතුරකු නිවැරදි මාර්ගයට ගැනීම සඳහා ඔබ දේව අභිමතය පරිදි ක්‍රියා කරන ආකාර 5ක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

05. I. ආබ්‍රහම් තුමා තම විශ්වාසයේ ගමන නිසා ඉතා වේදනාකාරී හා අපහසු තීරණ රාශියක් ගන්නට සිදු වුවද නොපැ කිලව දෙවිඳුන්ට අපක්ෂපාතිව ක්‍රියා කළ ආකාරය නිදර්ශන 5ක් ඇසුරින් පැහැදිලි කරන්න.

II. පසුගියදා ශ්‍රී ලංකාව තුළ ඇති වූ තත්ත්වය තුළ බිඳ වැටුණු ජීවිත ගොඩනගා ගැනීමට හා විශ්වාසයට එල්ල වූ අභියෝග හමුවේ විශ්වාසය සුරක්ෂිත කර ගැනීමට කරන යෝජනා 5ක් විස්තර කරන්න.

06. I. මෝසෙස් තුමාගේ කැඳවීම, දිවැසිවර කැඳවීමක ලක්ෂණ අනුව ඉදිරිපත් කර ඇති ආකාරය නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

II. වර්තමාන සමාජය තුළ හා පාසල තුළ ඔබ දිවැසිවරයෙකු මෙන් ක්‍රියා කරන ආකාර 5ක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

07. I. ශුද්ධවූ බයිබලයේ ඇතුළත් මැවීමේ පළමු කථාව තුළින් මැවීමේ පළමු ක්‍රියාවලියේ උච්චස්ථානය මිනිසා මැවීම බව ප්‍රකාශ කරයි. මේ මතය කරුණු 5ක් ඇසුරින් විස්තර කරන්න.

II. දේව ස්වරූපයට මැවූ මිනිසාට ඇති වගකීම වන දේව මැවිල්ල සංරක්ෂණය කරමින් පරිභෝජනය කිරීම හා වැඩි වර්ධනය කිරීමට ඔබ කරන යෝජනා 5ක් විස්තර කරන්න.

08. I. පංච පුස්තකය රචනා වීම සඳහා දායක වූ දේව ධාර්මික සම්ප්‍රදායන් 4 පිළිබඳව වෙන වෙනම පැහැදිලි කරන්න.

II. අප අපගේ පූජනීය ග්‍රන්ථය වන ශුද්ධ බයිබලයට ගරු කරමින් එදිනෙදා ජීවිතය තුළ දේව නීතිය පිළි පැදීමට යොමුවන ආකාර 5ක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.

# (43) ක්‍රිස්තියානි ධර්මය 12 ශ්‍රේණිය-2019 පළමු වාර පරීක්ෂණය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 11 | 3 | 21 | 1 | 31 | 2 | 41 | 2 |
| 02 | 4 | 12 | 3 | 22 | 3 | 32 | 1 | 42 | 3 |
| 03 | 5 | 13 | 2 | 23 | 4 | 33 | 2 | 43 | 1 |
| 04 | 3 | 14 | 5 | 24 | 2 | 34 | 4 | 44 | 4 |
| 05 | 5 | 15 | 1 | 25 | 4 | 35 | 4 | 45 | 2 |
| 06 | 2 | 16 | 2 | 26 | 3 | 36 | 2 | 46 | 2 |
| 07 | 2 | 17 | 3 | 27 | 3 | 37 | 4 | 47 | 4 |
| 08 | 1 | 18 | 1 | 28 | 2 | 38 | 1 | 48 | 4 |
| 09 | 3 | 19 | 3 | 29 | 3 | 39 | 4 | 49 | 1 |
| 10 | 4 | 20 | 1 | 30 | 5 | 40 | 5 | 50 | 1 |

(ලකුණු 2 x 50 = 100යි.)

## II පත්‍රය

### I කොටස

01. I. අසිරියාව ,බැබිලෝනියාව , මිසරය. (ලකුණු 1 x 2 = 2යි.)

II. කපර්නාවුම , බෙත්සයිදාව , මග්දලාව ,තිබේරියස්.(ලකුණු 2 x 2 = 4යි.)

III. 1. ආර්ථික ක්‍රමයේ වෙනස්කම් - වෙළඳ ව්‍යාපාර ඇති වීම, නැව් හිමිකර ගැනීම ජාත්‍යන්තර වෙළඳාම දක්වා විහිදීම

2. පරිපාලන වෙනස්කම් - දිස්ත්‍රික්ක 12කට බෙදා සෑම දිස්ත්‍රික්කයක් ම පාලනය කිරීමට නිලධාරියකු පත් කර පැරණි ගෝත්‍ර ක්‍රමය වෙනුවට රාජ්‍ය පාලන ක්‍රමයක් ඇති කිරීම

3. මුළු දේශය ම එක්සත් කර රාජ්‍යය වඩාත් ස්ථාවර බවට පැමිණ වීම- යුප්‍රටීස් ගංගාවේ පටන් පිලිස්තිවරුන්ගේ දේශය හා මිසරය දක්වා වූ ප්‍රදේශයේ ඔහුගේ අණසක

4. නාගරීකරණය කරා යාම තුළ විශාල සමාජ අසමානතා බිහිවීම

5. රාජකාරිය ක්‍රමය හෙවත් දිළිඳුන්ගෙන් බලෙන් වැඩ ගැනීම සලමොන්ගේ පාලන සමයේ දී ඉතා දරුණු ප්‍රතිඵලත්තියක් වී මිනිසුන්ට ඉතා හිංසාකාරී තත්ත්වයකට පත් වීම

6. වියදම් පියවා ගැනීම පිණිස අධික බදු අය කිරීම

ක්‍රම ක්‍රමයෙන් සලමොන් රජතුමාගේ පාලනය කෙරෙහි ජනතාව තුළ අසහනයක් මතු වීම

(ලකුණු 2 x 3 = 6යි.)

IV. සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු පිරිනමන්න.(ලකුණු 2 x 4 = 8යි.)

02. I. ශුද්ධ ලියවිල්ල දේවානුභාවයෙන් ලියවුණු බව , එහි කර්තෘ දෙවියන් වහන්සේ බව .

II. (2 තිමති 3:16): 1. ඉගැන්වීමට 2. දුර්මත දුරුකිරීමට 3. හික්මවීමට 4. ධර්මිෂ්ට ජීවිතයක් ගත කිරීමට උපදෙස් දීමට

III. 1. එඩේරික දේවානුභාවය උදා:- සැම්සන් (වීරා 14:19), දාවිත් (1 සාමු 16:13), මෝසෙස් තුමා (යෙසා 63:11) හා මෙසියස් වහන්සේ (යෙසා 11:2, 61:1, ලූක් 4:18-19)

2. දෙසීම සඳහා වූ දේවානුභාවය උදා:- දිවැසිවරු, ජේසුස් වහන්සේ, අපෝස්තුලුවරු (2 පේදුරු 1:21, ලූක් 4:18, 12:11-12)

3. ලිවීම සඳහා අණ ලැබීම • ලිවීම සඳහා ලැබුණේ අණක්
(නික් 17:14, ද්වි 5:22, 31:24, යෙසා 30:8, ජෙර 30:2)
(එක් බයිබල් පාඨයක් උදාහරණ ලෙස ලියා තිබිය යුතුය.)

IV. සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු පිරිනමන්න..

03. I. ''ව්‍යවස්ථාව'' නැතහොත් ''ඉගැන්වීම

II.

- මැවීම පිළිබඳ කතා දෙකක් (උත්.1:1-2:4අ, 2:4ආ-25)
- දස පනත පිළිබඳ සඳහන්වීම් දෙකක් (නික්. 20:2-17, ද්වි. 5:6-21)
- නෝවාගේ නැවට ගත් සතුන් ගණන (උත්. 7:2, 7:8)
- එක ම තැනැත්තාට, එක ම ස්ථානයට නම් දෙකක්
  මෝසස් තුමාගේ මාමණ්ඩි : '' රගුවෙල්'', ''ජෙත්‍රෝ''
  දෙවියන් වහන්සේ : ''යාවේ'', ''එලෝහිම්''
  සීනයි කන්ද : සීනයි, හොරෙබ්

III.

- දෙවියන් වහන්සේ ආදම් හා ඒවට ඇඳුම් සකස් කරදීම (උත්. 3:21)
- දෙවියන් වහන්සේ නෝවාගේ නැවේ දොර වැසීම (උත්. 7:16)
- දෙවියන් වහන්සේ කුඹල්කරුවෙකි. (මිනිසාව දුහුවිල්ලෙන් මවයි)(උත්. 2:7)
- වැවිලිකරුවෙකි(දේව අණට පිටු පෑ මිනිසා සොයා ඒදන් උයනේ සක්මන් කරයි. (උත්. 2:8) උයන් පාලකයෙකි. (උත්.2:8-9)
- ශල්‍ය වෛද්‍යවරයෙකි (ආදම්ගේ ඉල ඇටයෙන් ස්ත්‍රීය මවයි)(උත්. 2:21)ත.

IV. සිසු පිළිතුර අනුව ලකුණු දෙන්න.මුළු දිව්‍ය පූජා යාගයට බැති සිතින් සහභාගී වීම.
දහම් පාසලට සම්බන්ධ වීම
රෝගීන් බැලීමට යාම
ශ්‍රමදාන වැනි පොදු කාර්‍යයන් වලට සහයෝගය දීම.

## II කොටස

04. I. සර්පයා- 1. ''බඩගෑම හා දූවිලි කෑම'' (උත්පත්ති 3:14). මෙයින් අදහස් කරන්නේ සියලු යහපත් දේ අහිමි වී අසරණ තත්ත්වයකට පත්ව ඇති බව ය.
2. සර්පයා හා ස්ත්‍රිය අතර ද සර්පයාගේ වංශය හා ස්ත්‍රියගේ වංශය අතර ද බද්ධ වෛරයක් ඇති කිරීම : සර්පයාට පමුණුවන දඬුවමේ දී ''ඔහු තගේ හිස පොඩි කරන්නේ ය.'' (උත්පත්ති 3:15)
ස්ත්‍රිය ලබන දඬුවම ත්‍රිවිධාකාර වේ: 1. ගැබ් ගැනීමේ වේදනාව බොහෝ සේ වැඩිවීම
2. විලි රුදාව ඇති ව දරුවන් ප්‍රසූත කිරීම
3. ස්ත්‍රිය පුරුෂයා කෙරෙහි දැඩි ආශාව ඇති ව සිටිය ද, ඔහු ඇය පාලනය කිරීම
පුරුෂයා ලබන දඬුවම දෙයාකාර වේ.
1. දිවි ඇතිතාක් වෙහෙස මහන්සි වී ආහාර ලබා ගත යුතු වීම
2. මරණය රැකවරණය - හම් වස්ත්‍ර සාදා දීම(ලකුණු 10 යි.)
II. සිසු පිළිතුරු අනුව ලකුණු දෙන්න(ලකුණු 10යි.)

05. I. තමාගේ දේශය අත්හැරීම,නෑදෑයන් අතහැරීම , දරුවන් නොමැති කම ,වයස්ගත වීම ( පොරොන්දු ලබා දීමේදී),එකම දරුවා යාගයක් ලෙස ඔප්පු කිරීමට සූදානම් වීම.(ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න)
II. කාලෝචිතව ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

06. I. 1. දේව දර්ශනය (නික්මයාම 3:1-6)
2. දෙවිඳුන් දූතික සේවාව ඉදිරිපත් කිරීම (නික්මයාම 3:7-10)
3. කැඳවීම භාර ගැනීමට මෝසෙස් තුමා මැළි වීම (නික්මයාම 3:11 , 3:13 , 4:1 , 4:10 , 4:13)
4. දෙවියන් වහන්සේ විසින් දිරිමත් කරනු ලැබීම (නික්මයාම 3:12 , 3:14 , 4:2-9 , 4:11-12, 4:14)
5. යවනු ලැබීම (නික්මයාම 4:17)

II. සත්‍යයට සාක්ෂි දැරීම.
ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට අවනත වී කීකරු වීම.
අධ්‍යාපන කටයුතු සාර්ථකව කර ගැනීම
අන් අයට ආදර්ශයක් වීම
නොදන්නා දුර්වල සිසුන් හට මඟ පෙන්වීම
සහජීවනයෙන් ක්‍රියා ශීලීව කටයුතු කිරීම.

07. I. අපගේ ස්වරූපය අනුව, අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා මවමු.'' යන ගෞරවාන්විත බහුවචනය භාෂා රීතිය භාවිත කිරීම.
විවිධාකාර සත්ත්ව වර්ග සිටිය ද එක ම මිනිස් වර්ගයක් ගැන පමණක් සඳහන් කෙරේ.
මෙලොව දෙවියන් වහන්සේගේ ස්වරූපයට හා සමානකමට ඇති එක ම වස්තුව පුරුෂයා හා ස්ත්‍රිය පමණි. දෙවියන් වහන්සේගේ ''ස්වරූපය හා සමානකම'' දරන මිනිසා මේ ලෝකය තුළ දේව නියෝජිතයෙකි.
විශේෂ ආශිර්වාදයක් ලැබීම.උත්. 1:28 හි මෙසේ සඳහන් වේ. '' දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී, පොළොවපුරා පැතිර එය යටත් කර ගන්න.
වගකීමේ ස්වභාවය පැවරීම.(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 28-29)

II. පරිසරය දූෂණය කිරීමෙන් මිදී එය වැලැක්වීමට දායක වීම.
අනාගත පරපුර වෙනුවෙන් සම්පත් ඉතිරි කිරීම.
භෞතික සම්පත් වැඩි වර්ධනය කර ආත්මාර්ථයෙන් තොරව බෙදා ගැනීම.
සොබාදහමට ආදරය කිරීම හා ගරු කිරීම.
පරිසර විනාශයේ ප්‍රතිවිපාක පෙන්වා දීම.

08. I. යාවේ , එලෝහිම් ,ද්විතීය නීති හා පූජක සම්ප්‍රධායන් පැහැදිලි කර තිබීම.
(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 19-25)

II. දසපනතට අනුකූලව ජීවත් වීම.
භාග්‍ය අටේ ගුණාංග තම ජීවිතය තුළ ක්‍රියාවට නැංවීම.
ආත්මීක ශාරීරික පුන්‍යක්‍රියා ප්‍රතිපත්ති කර ගැනීම.
යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම.
ප්‍රසාද නිධාන ලබා ගැනීම.

අවසාන ලකුණු ගණනය කිරීම : 1 පත්‍රය - 100
2 පත්‍රය - 100
අවසාන ලකුණු 200 - 2- 100